We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
*Immigration Lawyer*
*Migration Agent Reg: 96/86306*

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002




''සිරස සුපර් ස්ටාර්" වැඩසටහන තරම්, කතාබහට ලක්වුණු ප්‍රේක්ෂක අවදානය දිනාගත් වැඩසටහනක් මෑත කාලයේ කිසිඳු ශ්‍රී ලාංකීය රූපවාහිනී නාලිකාවකින් විකාශය නොවුන තරම්ය. රටේ සියළු අවශේෂ, ප්‍රශ්න පසුපසට විසිකරමින්, කේන්ද්‍රීය මාතෘකාවක්, බවට පත්වීමට තරම් හේතුවුණු මේ වැඩසටහන, තුළ පැහැදිලි දේශපාලනයක් ක්‍රියාත්මක වන ආකාරයක්ද, අපට දැකගත හැකිවිය. මේ ඒ -දේශපාලනය" සම්බන්ධව මෙරට මතවාදී දේශපාලන දහරාවේ සිටින ශූරතම ප්‍රකාශකයකු සේ පිළිගැනෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය, අනුරුද්ධ ප්‍රදීප් මහතා සමඟ අප කළ කථාබහකි.

**ප්‍රශ්නය :-** *පසුගිය කාලයේ, වැඩිම කථාබහට ලක්වුණු, රූපවාහිනී වැඩසටහනක් තමයි ''සිරස සුපර් ස්ටාර්" වැඩසටහන. මේ වැඩසටහන සම්බන්ධව ඔබගේ මූලික කියවීම, සාකච්ඡාවට ප්‍රවේශයක්, විදිහට පළමුව පැහැදිලි කර ගත්තොත්...*

**පිළිතුරු :-** මූලිකවම මේ වැඩසටහන හොඳ එකක්. මීට කලිනුත් මේ වගේ තරග තිබිලා ජයග්‍රහණයන් බිහිවුණා. නමුත් ඒ අයට ඒවායින්, මාර්කට් එක් හැදුනේ නැහැ. මෙතැනදි සිරස, මේ තරුණයන්ව -මාකට්" කරනවා, කියලා සමහරෙක් චෝදනා කරන්න පුළුවන්. නමුත් ඒ මාකට් කිරීම ඇතුළේ මේ තරුණයන්ටත්, මාකට් එකක් හැදෙනවා. ඒක අපි, කව්රුත් පිළිගත යුතුයි. අඩුම වශයෙන් අවසන් වටයට තේරුණු දොළොස්දෙනාව ගත්තොතින්, ඒ අය ඉතා විශාල ප්‍රමාණයෙන් ලංකාවේ ජනප්‍රිය වුණා. අද පවතින වෙළෙඳ ආර්ථිකයත් එක්ක ගත්තහාම මේක සල්ලි ගොඩක් විදයම් කරලා කරගත යුතු දෙයක්. ඒ නිසා මූලිකවම, මේ වැඩසටහන, හරහා තරුණයන් කිහිපදෙනෙකුව ජනප්‍රියත්වයට පත්වීම, කියන එක හොඳ කාරණයක්. ඒ වුණාත් මේකේ යම් යම් කැපී පෙනෙන අඩුපාඩුවක් තිබුණා.

**ප්‍රශ්ණය :-** *මොනවද, ඔය තරමට තිබුණු අඩුපාඩු.*

**පිළිතුරු :-** මූලිකවම, විනිශ්චය සම්බන්ධව. අන්තිම හතලින් අටදෙනා දක්වා, හිටපු විනිශ්චය මණ්ඩලය විසින් දීපු තීරණ හොඳයි කියලා මම හිතනවා. ඒක හොඳ ඇගයීමක්. අනික් අතට විශේෂඥයන්ගේ ඇගයීමක්. ඊළඟට SMS වලටත් තැනක් දෙන එකේ වැරැද්දක් නැහැ. ඒත්, කරුණු දෙකක් නිසා ඒක නරක අතට හැරුනාය කියලා පුද්ගලිකව මම හිතනවා. එක තැනකින් පස්සේවත්, එහෙම නැත්නම්, සමස්ථ තරගය පුරාවටත් විශේෂඥ විනිශ්චයන්වලට යම් තැනක් දීමට තිබුණා. 50% ක් ඒ හරහා දීලා තව 50% ක්''ඒ වලින් දෙන්න තිබුණා. ඒත් එහෙම නොවී, තනිකරම පොදු ජනතාවට අවස්ථාව දීමෙන්, සමහර ප්‍රශ්න ඇතිවුණාය කියලා මම හිතනවා. අනිත් අතට අද SMS වලින් ජනප්‍රියත්වය, හරියටම මනින්න පුළුවන්ද කියන එකත් සැක සහිතයි.

**ප්‍රශ්නය :-** *මේ සියල්ල මධ්‍යයේ මේ තරගය පසුව විශාල දේශපාලන කාරණාවක් බවට පත්වුණා. අපේ සමාජයේ ප්‍රධාන දේශපාලන ව්‍යාපෘති සියල්ලම පාහේ මේ සංවාදයට මැදිවුන බවක් පෙනෙන්නට තිබුණා.*

**පිළිතුර :-** පිරිමි කුමන්ත්‍රණය කරලා, පිරිමි අයව දිනෙව්වා කියලා සමහර ඊනියා, කාන්තා විමුක්තිකාමිනියන් කියලා තිබුණා. නමුත් ඒක එහෙම්පිටින්ම වැරදියි. මුල ඉඳලා අවසානය වනතෙක්ම මේ තරගය හා සම්බන්ධ වෙලා හිටියේ, පිරිමින්ට වඩා කාන්තාවන් ය කියන එක, ඕනෑම කෙනෙක් පිළිගත යුතු පිළිගන්න දෙයක්. සාමාන්‍යයෙන් ගත්තාහම විරුද්ධ ලිංගිකයන්ට ආකර්ෂනය වැඩියි. ඒක හැමතැනකදිම තියෙන දෙයක්. පිරිමියා එතැනදි බොහෝවිට බලන්නේ, තමන්ගේ පෞද්ගලික උපයෝගීතාවය ගැන විතරයි. නමුත් කාන්තාව දුරස්ථව හිඳින වීර පිරිමි චරිතවලට ආකර්ෂණය වෙනවා වැඩියි. ඒකම තමයි මෙතැන වුණේ. ඇත්තටම මේක කාන්තාවන්ගේ විශේෂ ගුණයක්. ඒ නිසා කොරහේ කිඹුල්ලු දකින විදිහෙන් මේ දිහා බලන්න එපා ය, කියලා ඔය -ඊනියා" කාන්තා විමුක්තිකාමිනියන්ට, මම කියන්න කැමැතියි.

පැහැදිලිවම, මේකට දේශපාලනික වශයෙන් කරපු මැදිහත්වීම් අනවශ්‍ය එකක්. මම දේශපාලනය කියලා කියන්නේ හැමතැනම දේශපාලනය තියෙනවා කියන අර්ථයෙන්ම නෙමෙයි. ඒක කිව යුතුමයි. ඒ වගේම මෙතැනදි සිරස පැත්තෙනුත් වරදක් වෙලා තිබුණා. ඔවුන් දිගටම මාධ්‍ය හසුරුවලා තියෙන ආකරය තුළ ඉතා විශාල උද්දච්චතාවයක් මම පෞද්ගලිකව